
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

*Phone* : 020 74289388
*Fax* : 0871 9005163
E-mail : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



ලංකාවිත්ති ලිපිනය වෙනස්වූ බව කරුණාවෙන් සලකන්න.
මේ නව ලිපිනයයි.

**Lanka Viththi address has been changed.
Please note the new address.**

## මතක අමතක

අප ශ්‍රීලංකාවේ මහා විපයඝ්‍යසයක් සිදුවී මාස දෙකක් පසුවන්නට ආසන්න මේ මොහොතේ ලංකාවේ බොහෝ දෙනාට දැන් කතාකරන්නට දෙයක් නැතුවාසේ ය. ඉස්සර තොරතෝංචියක් නැතුව යුද්ධය ගැන කතා බස් කළ හැටි අප කාටත් මතකය. මව්බිමට දුර කතන පණිවුඩයක් දුන් කල්හි එදා අසන්නට ලැබුණේ බොහෝ විට ඒ දවසේ සිදුවූ හද කකියවන පුවතකි. එසේම ලංකාවෙන් දුර කතන පණිවුඩයක් හෝ එස් එම් එස් පුවතක් හෝ ආවේ නම් ඒ කිසියම් ව්‍යසනයක තොරතුරක් අපට දැන්වීමට ය. ඇතැම් විට මහ රෑ ද ටෙලිපෝනය නාදවිය. සමහර පණිවුඩයක් ගෙදරින් ආවේ බයවෙන්න එපා මේ සැප දුක් අහන්නයි කතා කළේ යන වචන පෙළ මුලටම සඳහන් කරමිනි. මිතුරන් එකතුවන සාදයකට, දරුවන්ගේ උපන්දින උත්සවයකට, මගුල්ගෙදරකට, පන්සලට ගිය විට ඒ කාලයේ ප්‍රස්තුතය ලංකාවේ දේශපාලනමය තත්වය සහ කොටි ත්‍රස්තවාදයයි. අප පුවත්පතක් ගත් සැනින් පෙරළුවේ ලෝක ප්‍රවෘත්ති පිටුවයි. ටෙලිවිෂනයේ සීපැක්ස් හි අප උදේම බලන්නේ පෙර දින ශ්‍රීලංකාව ගැන තොරතුරක් ඇත්ද යන්නයි. මව්බිමෙන් බැහැරව විදේශගතව සිටින අප සිංහළ බහුතරයක දෛනික තත්වය ඒ සමයේ එසේ වූයේ ය.


අතීතයේ සිදුවූ ඇතැම් දේ විශේෂයෙන් අමිහිරි නීරස අප්‍රසන්න බියකරු දේ ගැන යළි නොසිතන්නට, ඒවා සිතින් මකා දමන්නට දැඩි උනන්දුවක් මිනිස් මනස තුළ ජනනය වීම සාමාන්‍ය ස්වභාවයයි. එය අප කාටත් පොදුය. එහෙත් මෙහි දී කළයුත්තේ අතීතය නැවත ජීවත්කරවමින් කතාබහ කිරීම නොව, අතීතයේ සිදුවූ දේ සහ එම අත්දැකීම් තුළින් යළිත් ඒවා නොවන්නට වර්තමානය සකස්කර ගැන්ම ය. යුද්ධය නීරස දෙයක් වුවද එය එක් අතකට අධ්‍යාපනයකි. අපේ සිත්සතන් යම් යම් කම්පනයන්ට කොපමණ ප්‍රමාණයක් ඔරොත්තු දෙනවාද යන්න පරීක්ෂණයට භාජනය කිරීමකි. යුද්ධයෙන් රටක් ඉගෙන ගන්නා පාඩම් ඒ රටේ අනාගතයේ අභිවෘද්ධියට යොදා ගත යුතු ය. අමතක කළ යුත්තේ, යළි නොසිතිය යුත්තේ යුද්ධයේ කටුක පැත්ත පමණ ය. එහෙත් යුද්ධයෙන් අපේ ධෛර්‍යය හා කම්පනයට ඔරොත්තු දෙන ස්වභාවය කාලය විසින් උරගා බැලූ සැටි සොම්නසින් සිහිකළ හැක්කේ යුද්ධයෙන් ජයග්‍රහණය ගැණ පමණක් නොව මාහැඟි පාඩම්ද අප රටට ජනතාවට ඉගෙන ගන්නට හැකිවූ නිසාය. එනිසා යුද්ධය අමතක කළාට කමක් නැත. එහෙත් එය අපට උගැන් වූ පාඩම් කිසිසේත් අමතක කළයුතු නොවේ.

කලින් බොහෝ වතාවල අප සඳහන් කළා මෙන් අපේ සතුරන් මිතුරන් හඳුනාගත්තෙමු. බාහිර තර්ජනයනට අපට සාර්ථකව මුහුණ දිය හැකි බව පසක් කරගත්තෙමු. ශ්‍රීලංකාවට ජාතියක් වශයෙන් නැගී සිටින්නට ශක්තියක් ඇති බව දැනගතිමු. අපේ ජීවනාලිය අපේ තරුණ පෙළ බව හැඳිනුවෙමු. එසේම ඒ සියල්ල ට ම වඩා අප ජනතාව තුළ වූ දේශප්‍රේමය මහා ප්‍රවාහයක් සේ නැගී අවුත් අප අකාශ තලයටම ඔසවා තැබූ සැටි දෑසින් දුටුවෙමු.

# The Buddhist Contribution to Good Governance

# යහ පාලනය සඳහා බොදුමග

**By Ven. Ajahn Brahmavanso - Western Australia**



The oldest multinational corporation in the world is the **Buddhist Sangha**. As it happens, I have the franchise in Western Australia where I am the "managing director" of **Bodhinyana Monastery** in **Perth** and the "**CEO**" of the **Buddhist Society of Western Australia.** So I should know a great deal about Buddhist Good Governance.

Buddhism has been a positive inspiration for many world leaders. Few know that the British statesman and war time prime minister, Winston Churchill, had a statue of the Buddha by his bedside throughout the second world war, while his wife, Clementine, had a statue of Kuan Yin, the Buddhist goddess of mercy.

I would like to discuss the Buddhist contribution to good governance using the Buddhist monastic code and other Buddhist principles to illuminate the following three modern categories of governance:

1. Leadership Skills
2. Decision Making
3. Problem Solving

### Leading by example

The great political leader, Mahatma Gandhi, succeeded in liberating his country of India from colonial domination with surprisingly little bloodshed. The leadership skills that he possessed were developed over a lifetime and were essential to his ability to maintain harmony in all the diverging factions of the independence movement. The greatest of his leadership skills, in my view, was his ability to lead by personal example.

When Gandhi was young and studying law in London, he resided in a common boarding house. One day, his landlady asked him for help with her teenage son. The landlady complained that her son was eating too much sugar and that he would not listen to his mother's advice, but he was in awe of their young Indian tenant, Mr Gandhi. Perhaps, she thought, if Mr Gandhi would ask her son not to eat so much sugar, then he might stop. Mr Gandhi agreed to speak with his landlady's son.

A fortnight later, the landlady complained to Mr Gandhi that her son was still eating too much sugar and asked why he had not spoken to him yet. Mr Gandhi replied that he had spoken to her son, but only that morning. When Mr Gandhi was asked by his landlady why he had waited a fortnight to counsel her son, he replied that he had to wait until he himself had given up sugar, and that was only yesterday.

A leader who would only ask others to do what they already do themselves, is one who leads by example. They will be successful whereas the others, the hypocrites, will be ignored.

**The Buddha clearly taught that the leaders of the Sangha should not be allowed to be preceptors or teachers unless they have sufficient virtue, meditation experience, and wisdom. Buddhism extols leading by example.**

ලොව පැරණිතම බහුජාතික සංස්ථාව බෞද්ධ සංඝ සමාජයයි. බෞද්ධ දර්ශනය බොහෝ ලෝක නායකයින්ගේ ක්‍රියාකාරකම් වලට ධනාත්මක ශක්තියක් සැපයූ බව කිව යුතුය. බ්‍රිතාන්‍යයේ යුද සමයේ අගමැති වින්ස්ටන් චර්චිල් මහතා මුළු යුද මෙහෙයුම් කාලය තුළම සිය ඇඳ ළඟම බුදු පිළිමයක් තබාගෙන සිටියේ ය. චර්චිල් ආයඝ්‍යාව වන ක්ලෙමන්ටයින් මහත්මිය ළඟ කරුණාවට අධිපති දෙවඟනකගේ ප්‍රතිමාවක් විය.

යහපත් පාලනයකට නායකත්වයේ හැකියාව අවශ්‍ය බව බුදු දහම පෙන්වා දෙයි එසේ ම නායකයා සිය ක්‍රියාවන් තුළින් ම අන් අයට ආදර්ශය සැපයිය යුතුය.

ඉන්දියානු නිදහස් සටනේදී මහත්මා ගාන්ධි මුළු මහත් භාරතයටම ආදර්ශයක් ශක්තියක් වූ බව අපි දනිමු. එය ඔහුගේ ජීවිතය පුරාම විය. තරුණ කාල යේ ගාන්ධි ලන්ඩනයේ ඉගෙනීම කළ කාලයේ නිවසක නැවතී සිටියේය. ඒ නිවසේ සිටි කාන්තාවගේ කුඩා පුත්‍රයා බෙහෙවින් සීනි කෑමට ඇබ්බැහි වී සිටියේය. ඒ ළමයා ගාන්ධිට බය ය. ගාන්ධි ලවා අවවාද කළහොත් ළමයා සීනි කෑම නවතාවියයි සිතූ කාන්තාව පුතාට අවවාද කරන ලෙස ගාන්ධිට පැවරුවාය.

එහෙත් දින දෙක තුනක් ගියද තවමත් ළමයා පෙර සේ සීනි බෝතලේ කන බව දුටු කාන්තාව පුතාට අවවාද කළේ නැද්දැ ගාන්ධිගෙන් ඇසුවාය. නැහැයි කී ගාන්ධි " අද මම එයාට කියන්නම් " යයි කීය. මෙපමණ දිනක් නොකීවේ ඇයි දැයි ඇසූ විට ගාන්ධි කීවේ, තමාට සීනි කෑම නවත්වන්නට හැකි වූයේ කලින් දා හවස බව ය.

ආදර්ශමත් නායකයා එවැනිය. පළමුකොට ආදර්ශය තමාම ක්‍රියාවෙන් පෙන්වන්නෙකි. අන් අයට කරන්නට කියන්නේ ඉන් පසුවය. සැබෑ නායකත්වය එය විය යුතුය. තමා නොකරන දේ අනුන්ට පමණක් දෙසීම කුහකකම මිස යහ පාලනය නොවේ. බුදුන්වහන්සේ පැහැදිලිවම උගන්වා ඇත්තේ සංඝ සමාජයේ නායකත්වය දරණ අය තුළ සැහෙන සුශීලත්වය, භාවනාබෝධය සහ පරිණත ඥාණය නිසැකවම තිබිය යුතු බව ය.

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතොපදේශයෙන්

**පරාපවාදෙ බධිරඃ - පරවිපිද්‍රෙෂ්ව ලොචනඃ
පංගුකර්මෙ ස්වනාර්යෙෂු - දුස්සංකල්පෙ ස්වචෙතනං**

***අර්ථය*** : **නුවණැත්තේ අනුන්ගේ නුගුණ ඇසීමෙහි බිහිරෙකු වැනි ය. අනුන්ගේ සිදුරු දැක්මෙහි ඇස් නැත්තෙකු වැනි ය. පව් කිරීමෙහි පිළෙකු වැනි ය. නපුරක් කරන්නට සිතීමෙහි සිත් නැත්තෙකු වැනි ය.**

මෙම පද්‍යයෙන් පෙන්වා දෙන්නේ නුවණැති සත්පුරුෂයන්ගේ ලක්ෂණ හතරකි. අනුන්ගේ නුගුණ ඇසීම, අනුන්ගේ සිදුරු නොසෙවීම, පව් කිරීමෙන් වැලකීම සහ නපුරු දේ සිතීමෙන් වැලකීම ඒ හතරයි. සමාජයේ ජීවත්වන බොහෝ දෙනෙකුගේ සාමාන්‍ය ජීවිතයේ අංගයන් බවට පත්ව ඇති මෙම කරුණු පිළිබඳව බුද්ධිමත්ව අප ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න මෙහිදී විස්තර කොට ඇත.

බොහෝ දෙනෙකුගේ කතා බස් හරසුන් ඒවාය. හරවත් යමක් ඇත්තේම නැති තරම් ය. ඒවා තමන්ට හා අනුන්නට පලක් නැති වචන පමණක් ම ය. හරවත් යමක් නොමැති තැන ඇත්තේ සාමාන්‍ය ව්‍යවහාරයට අනුව වල්පල් ය. එකි නෙකා පිළිබඳව ඕපාදූපය. බොහෝ විට මීට අයිති වන්නේ අනුන්ගේ නුගුණයන් මය. බුදුදහමේ මෙය හඳුන්වන්නේ සම්පප්‍රලාප හෙවත් හිස් වචන ලෙසයි. බොහෝ දෙනා අනුන්ගේ අඩුපාඩු සහ නුගුණ කතාකිරීමට හා ඇසීමට රුචි කරති. ඇති තැන නැති ගුණ වැනීමත්, නැති තැන ඇති ගුණ මැකීමත් බොහෝ දෙනාගේ සිරිතය. බුදු දහමට අනුව කෙනෙකු මෙලොවට බිහි වන විට ඔහුගේ මුවෙහි තියුණු කෙටේරියක් ඇතිව උපදින බවත්, බොහෝ දෙනා මෙම වචන නමැති කෙටේරියෙන් බොහෝ විනාශ සිදුකරන බවත් දක්වා ඇත. මෙම පද්‍යයට අනුව අනුන්ගේ නුගුණ නොඇසීමෙහි බුද්ධිමතාගේ පිළිවෙත නම් ඒවා නෑසෙන සේ බිහිරෙකු මෙන් සිටීමයි.

දෙවැනි කරුණ අනුන්ගේ සිදුරු සෙවීමෙන් වැළකී සිටීමයි. බොහෝ දෙනෙකුගේ තවත් එක් දුර්වලකමකි අනුන්ගේ අඩු පාඩු හෙවත් සිදුරු සෙවීම. "**තමා වරද නොදිස්නේ, මෙරමා දොස්ම දිස්නේ**" යන පද්‍ය පාඨයෙන්ද දක්වන්නේ එයයි. එවන් අයට තම වරද නොපෙනෙනා අතර අන් අයගේ වරද පමණක්ම පෙනේ. " තමාගේ ඇහේ තියන පොල් පරාලය නොපෙනුනත් අනුන්ගේ ඇහේ තියන පොල්කෙන්ද පෙනෙනවා" යන කියමනද මේ හා සම්බන්ධ වූවකි. නුවණැත්තන්ගේ ලක්ෂණය නම් අනුන්ගේ සිදුරු නොසොයා ඇස් නැත්තන් මෙන් හැසිරීමයි.

මෙහි තෙවෙනි හා සිව්වෙනි කරුණු දෙක වන පව්කිරීමෙහි හා නපුරු සිතුවිලි ඇතිකරගැනීමෙහිදී බුද්ධිමතුන් ක්‍රියාකරන්නේ පිළෙකු හෙවත් අංගවිකළ වූවකුගේ සහ සිත් නැත්තෙකුගේ ආකාරයෙනි.

ලොව උපත ලබන සෑම මනුෂ්‍යයෙකුගේම ජීවිත සාර්ථක කරගත හැකිවන්නේ අවංක හිතකාමී මිනිසුන්ගේ සහාය ලබාගැනීමෙනි. කිසියම් මිනිසෙකුට සැබැවින්ම තම ජීවිතය ගැන ගැන සිතා සතුටුවිය හැක්කේ ද අන් අයට පීඩාවක් නොවන ලෙස ජීවත් වුවහොත් පමණි.

එලෙසම අපගේ දෛනික කායඝ්‍යයන්ට බාධාකරන්නන් සිටීමෙන් අපට ජීවිතය ගැන පුළුල්ව සිතීමට හැකියාව ඇතිවෙයි. සමාජයේ ඉහළ තල වලට පත් අය බොහෝ බාධාකිරීම්, වැලකීම් මැදින් අධිෂ්ඨානශීලීව ඉදිරියට ගිය අයයි.

තම ධනය බලය වැනි ලෞකික දේ රැක ගැන්මට ලොව බොරුවෙන් නොරැවටිය යුතුය. අනුන්ට දොස් පැවරීම අනුන්ගේ අඩුපාඩු සෙවීම හා නපුරු දේ කිරීම බිහිසුණු දේය. ප්‍රකෘති ජීවිතය වෙනස්කරන, විකෘති මානසික තත්වයන් උදාකරන, සදාචාර ධර්මයන් විනාශකරන, තමාත් සමාජයත් පහතට හෙලන පාපී සිතුවිලි වලින් සිත මුදවාගත යුතුයි. හැම විටම තමන්ටත් අනුන්ටත් සෙත සළසනු යෙහෙකැයි සිතා ක්‍රියා කළ යුතුය. එබඳු පුද්ගලයා මෙලොව බුද්ධිමත් උදාර පුද්ගලයෙකු වන අතර මියගියද නොමියන කෙනෙකු වන්නේය.



***♦ පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**

**Colombo Office**
**Visa Refusals**
**Property Purchase in Sri Lanka**

**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**